ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2026.03.04


ඩබ්ලිව්.එස්.එම්.සෙනෙවිරත්න
අංක 166, කෝන්වැව,
ඉපලෝගම,
මහව.

පැමිණිලිකාර පාර්ශවය

01. පො. සැ. 23427 සමන්
පොලිස් ස්ථානය, ගිරිල්ල

02. පො. කො. 77528 කසුන්
පොලිස් ස්ථානය, ගිරිල්ල

03. පො. සැ. 51801 කරුණාරත්න
පොලිස් ස්ථානය, ගිරිල්ල

04. ස්ථානාධිපති
පොලිස් ස්ථානය, ගිරිල්ල

වගඋත්තරකාර පාර්ශවය

**<u>පැමිණිලි අංකය: HRC/ANU/170/2023(S)</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තමා 2023.03.07 වන දින උදේ 8.00ට පමණ මොරගොල්ලාගම පදිංචි සඳුන් හමුවීම සඳහා ඔහුගේ නිවසට ගිය බවත්, වැව් මාළු ඇල්ලීම පිළිබඳව ඔහු සමඟ කතා කරමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසුනු පුද්ගලයින් තිදෙනෙකු යතුරු පැදිවලින් පැමිණි බවත්, ඔවුන් එනවිට වරෙන්තුවක් තියෙනවා පොලීසියෙන් තමයි එන්නේ කියා සඳුන් පැන දිවූ බවත් ය. එම අවස්ථාවේදී තවත් පොලිස් නිලධාරීන් තිදෙනෙකු සඳුන්ගේ නිවස පිටුපසට පැමිණ සිටි බවත්, ඔවුන්ද තමා සිටි තැනට පැමිණි බවත්, එම අවස්ථාවේ සඳුන්ගේ නිවසේ ඉදිරිපසින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසී සිටි තිදෙනා හා නිවස පිටුපස සිට පැමිණි තිදෙනා "උඹ මොකද මෙහෙ ඇවිත් ඉන්නේ" කියා තමාගෙන් ඇසූ බවත්, සඳුන් සමඟ මාළු ඇල්ලීමට පැමිණි බව තමා පැවසූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේදී තමා පැමිණි යතුරු පැදියේ යතුර එක් අයෙකු විසින් ගලවා ගත් බවත්, එම යතුර භාවිත කරන්නේ, තෙල් ටැංකිය සඳහා පමණක් වන බැවින් තමා තම යතුරු පැදියෙන් නිවසට පැමිණි බවත්, නිවසට පැමිණ පැය දෙකකට පමණ පසු සඳුන් තම නිවසට පැමිණි බවත්, එසේ පැමිණ ඔහුගේ පියාගේ ගංජා පැල, කසිප්පු සහ තුවක්කු බටයක් පොලීසියෙන් අල්ලා ගෙන ඇති බව දන්වා සිටි බවත්, ඉන් අනතුරුව ඔහු තම නිවසින් පිටව ගිය බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. ඊට ටික වේලාවකට පසුව ඉහත කී පොලිස් නිලධාරීන් හය දෙනා තම නිවසට පැමිණි බවත්, එසේ පැමිණ නිවස හා ගෙවත්ත පරීක්ෂා කරන ලද බවත්, ඒ අවස්ථාවේ පැමිණ සිටි එක් පොලිස් නිලධාරියෙකු සඳුන්ට කෝල් එකක් ගන්නා ලෙස තමාට පැවසූ බවත්, ඒ අනුව තමා සඳුන්ට කතා කළ බවත්, තමා විසින් සඳුන්ට පොලීසියට භාරවෙන ලෙසත් එසේ නොවුණහොත් තමාව පොලීසියට රැගෙන යාමට නියමිත බව පවසා සිටි බවත් පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් දක්වා ඇත.

අනතුරුව පොලිස් නිලධාරීන් විසින් කමිසයක් දාගන්නා ලෙස තමාට දැන්වූ බවත්, ඊට පසු තමාට පරුෂ වචනයෙන් බැන වැදී ගෙදර සිට මීටර් 500ක පමණ දුරින් පිහිටි කටුපිලගහ වැවට රැගෙන ගිය බවත්, එහිදී තමාට පරුෂ වචනයෙන් බැන වැදී නීතිවිරෝධී මත්පැන් ලබා දෙන ලෙස කියූ බවත්, තමා ඒ පිළිබඳව නොදන්නා බව ප්‍රකාශ කළ විට අත්දෙක පිටුපසට කර මාංචු දමා පොලුවලින් තම කකුල් වලට, පිටට සහ අත්දෙකට පහරදුන් බවත්, එක් අයෙකු තම පිටට පයින් ගැසූ බවත්, සවස 6.00ට පමණ පොලිස් නිලධාරීන් තමාව ගිරිල්ල පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේ දී තමාට වමනය ගිය බවත්, පසුව පොලිස් නිලධාරීන් විසින් තමාව ගිරිල්ල පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති කඩයකට රැගෙන ගොස් බිස්කට් අරන් දුන් බවත්, තමා එම බිස්කට් කෑවේ නැති බවත්, තමාට එම කඩය ඇතුලේදී ද පොලිස් නිලධාරීන් විසින් පහරදෙන ලද බවත්, ඉන් අනතුරුව තමාගේ කමිසයෙන් අල්ලා ඇදගෙන ගිරිල්ල පොලිස් ස්ථානයට නැවත රැගෙන ආ බවත්, පොලිස් ස්ථානයේ දී තමාට තර්ජනය කර හිස් කඩදාසි දෙකකට අත්සන් ලබා ගත් බවත්, ඉන්පසුව ගෙදර යන ලෙස තමාට දැන්වූ බවත්, එවිට රාත්‍රී 7.00 පමණ වී තිබූ බවත්, වමනය ගොස් සිටි බැවින් තනියම යන්න අමාරු නිසා ගෙදර ගෙනගොස් ඇරලවන ලෙස පොලිස් නිලධාරීන්ට පැවසූ බවත්, එවිට තමාට පහරදුන් එස්.එන්.ඩබ්ලිව්.එම්.කරුණාරත්න යන පොලිස් නිලධාරියා විසින් ඔහුගේ ත්‍රිරෝද රථයෙන් තමාව නිකවැරටියට ගෙනවිත් ඇරලවූ බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් 2024.01.31 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයට පෙනී සිටිමින් පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රකාශ ලබාදෙමින් කියා සිටින්නේ, නිකවැරටිය මහේස්ත්‍රාත් අධිකරණය විසින් මොරගොල්ලාගම පදිංචි සඳුන් සාලිත යන අයට වරෙන්තුවක් නිකුත් කර තිබූ බවත්, එම වරෙන්තුව අනුව ක්‍රියා කිරීම සඳහා 2023.03.07 වන දින අදාළ ස්ථානයට ඔවුන් තිදෙනා පිටව ගිය බවත්, වරෙන්තුකරු පොලිස් නිලධාරීන් දැක පැන ගිය බවත් ය.

එම අවස්ථාවේ තවත් සිවිල් පුද්ගලයෙකු එම ස්ථානයේ සිටි බවත්, ඔහුද පැන ගිය බවත්, අනතුරුව අදාළ නිවස පරික්ෂා කරන ලද බවත්, එම නිවසේ තිබී නීතිවිරෝධී මත්පැන් හා නීතිවිරෝධීව බඳින තුවක්කුවක් ද සොයා ගත් බවත්, එම නීතිවිරෝධී මත්පැන් හා තුවක්කුව එම නිවසේ සිටි කරුණාරත්න යන අයගේ බවට ඔහු විසින් පිළිගෙන ඉදිරිපත් වූ බවත්, ඔහුව අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු වරද පිළිගෙන ඇති බවත් 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත.

අනතුරුව පැන ගිය වරෙන්තුකරු වන සඳුන් සාලිත යන අය මොරගොල්ලාගම පදිංචි සෙනෙවිරත්න යන අයගේ නිවසට ගිය බවට බුද්ධි නිලධාරීන් විසින් තොරතුරක් ලබාදුන් බවත්, ඒ අනුව එම නම සඳහන් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන සෙනෙවිරත්න යන අයගේ නිවස සොයා එහි ගිය බවත්, නිවසට ගොස් සඳුන් සාලිත පැමිණියා ද යන්න සෙනෙවිරත්න යන අයගෙන් විමසූ බවත්, එවිට පැමිණිලිකරු වන සෙනෙවිරත්න යන අය විසින් සඳුන් සාලිත යන අය කටුපිලගහ වැවට මාළු ඇල්ලීමට ගිය බව පැවසූ බවත් 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇත. අනතුරුව මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන සෙනෙවිරත්න යන අය සමඟ කටුපිලගහ වැවට ගිය බවත්, මෙම පැමිණිලිකරුව කිසිදු අවස්ථාවක අත්අඩංගුවට ගෙන නොමැති බවත්, පැමිණිලිකරු පවසන ආකාරයට ඔහුට කිසිදු පහරදීමක් සිදුනොකළ බවත්, පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>4 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 4 වන වගඋත්තරකාර ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අංක GI/OUT/741/24 සහ 2024.09.05 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරු වන ඩබ්ලිව්.එච්.එම්.සෙනෙවිරත්න යන අය ගිරිල්ල පොලිස් වසමට අයත් අයෙකු නොවන බවත්, කොමිෂන් සභාව වෙත යොමුකර ඇති

පැමිණිල්ලේ සඳහන් ආකාරයට පැමිණිලිකරුට සිදු වූ අසාධාරණයක් සම්බන්ධව ගිරිල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිලිකරු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති බවත් ය. කෙසේ වුවද මෙම පැමිණිලිකරු විසින් නිකවැරටිය දිස්ත්‍රික්කයේ (II) භාරව කටයුතු කරන සහකාර පොලිස් අධිකාරී වෙත තමාට සිදු වූ පහරදීමක් පිළිබඳව පැමිණිල්ලක් කර ඇති බවත්, පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම, පහරදීම පිළිබඳව වන කිසිදු සටහනක් ගිරිඋල්ල පොලිස් ස්ථානයේ තොරතුරු පොත් වල සටහන්ව නොමැති බවත් 4 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, 4 වන වගඋත්තරකරු වන ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අංක GI/OUT/100/25 සහ 2025.01.28 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2023.03.07 වන දින තම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මොරගොල්ලාගම, තිඹිරියාව ලිපිනයේ පදිංචි වීරසූරිය මුදියන්සේලාගේ කරුණාතිලක යන අයගේ නිවසේ තිබී නීතිවිරෝධී මත්පැන් හා බදින කදක් ළග තබා ගැනීම සම්බන්ධයෙන් වැටලීමක් සිදුකර ඇති බවත්, මෙම වැටලීම සිදුකරන අවස්ථාවේදී මෙම පැමිණිලිකාර ඩබ්ලිව්.එච්.එම්.සෙනෙවිරත්න යන අය එම ස්ථානයේ සිට පලා ගොස් ඇති බවත් ය.

<u>නිරීක්ෂණ හා නිගමනය</u>

පැමිණිලිකරු විසින් තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු කිසිදු වරදක් කර නොතිබියදී වගඋත්තරකරුවන් තම නිවසට පැමිණ තමාව අත්අඩංගුවට ගෙන පහරදී වධහිංසාවක් සිදුකර තම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන ලද බවයි.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරුව කිසිදු අවස්ථාවක අත්අඩංගුවට ගෙන නොමැති බවත්, පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර නොමැති බවත් ය.

වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ගිරිල්ල පොලිස් ස්ථානයේ පොලිස් සටහන් උධෘත අනුව 2023.03.07 දින පැය 8.20ට ප්‍රජා පොලිස් අංශයේ දෛනික තොරතුරු සටහන් කිරීමේ පොතේ පිටුව 155 ඡේදය 52හි යොදා ඇති නිලධාරීන්ගේ පිටවීමේ සටහන අනුව 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් ගිරිල්ල පොලිස් වසමේ වැටලීම් රාජකාරී සඳහා පිටව ගොස් ඇති බවටත්, මෙම වැටලීම් රාජකාරියෙන් පසු එකී වගඋත්තරකරුවන් නැවත පොලිස් ස්ථානය වෙත පැමිණ නිලධාරීන්ගේ පැමිණීමේ සටහන් 2023.03.07 වන දින පිටුව 157 ඡේදය 56 යටතේ යොදා ඇති බවටත් නිරීක්ෂණය වේ.

1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන්ගේ පැමිණීමේ සටහන අනුව ඔවුන් වැටලීම් රාජකාරියේ යෙදී සිටියදී විශේෂ කාර්යාංශයේ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගෙන් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර ඇති බවටත්, මෙම වැටලීමේදී මොරගොල්ලාගම ප්‍රදේශයේදී

බදින කදක් හා නීතිවිරෝධී මත්පැන් ළග තබා ගැනීමේ වරදට විජේසූරිය මුදියන්සේලාගේ කරුණාතිලක නැමති අයෙකු පැය 11.10ට අත්අඩංගුවට ගෙන ඇති බවත් පෙනී යයි.

එසේම, 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් 2023.03.07 දිනයේම පැය 18.30ට පිටුව 164 ඡේදය 60හි පැමිණිමේ සටහන් යොදා ඇති අතර, එම සටහන අනුව එකී වගඋත්තරකරුවන් ගිරිල්ල පොලිස් වසමේ පාලුවදුරුස්ස, නාවාන, තිඹිරියාව, මොරගොල්ලාගම, ඉතැව, දොඩම්ගොල්ලේගම යන ප්‍රදේශ වල සංචාරය කළ බවත්, 2023.03.07 දින පැය 18.40ට පිටුව 392 ඡේදය 05 යටතේ යොදා ඇති විමර්ශන සටහන අනුව වැටලීම් රාජකාරියේ යෙදී සිටියදී පොලිස් නිලධාරියෙකු විසින් තොරතුරක් ලබාදුන් බවටත්, එම තොරතුර මගින් මොරගොල්ලාගම, තිඹිරියාව පදිංචි සඳුන් සාලිත යන අයට අධිකරණයෙන් නිකුත් වූ වරෙන්තුවක් ඇති බවටත්, එම තැනැත්තා සැගවී සිටින බවටත් දැනුම් දී ඇති බවත්, ඒ අනුව වගඋත්තරකරුවන් මෙම වරෙන්තුකරු සෙවීම සඳහා ද පිටව ගොස් ඇති බවත් නිරීක්ෂණය වේ.

ගිරිල්ල පොලිස් ස්ථානයේ විශේෂ කාර්යාංශයේ නිලධාරීන් දෙදෙනකු විසින් වැටලීම් රාජකාරියක නිරතව සිටි 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන්ට ලබාදුන් තොරතුර අනුව මෙකී වගඋත්තරකරුවන් විසින් අදාළ ස්ථානය වටලා ඇති බවත්, එම වැටලීමේදී අදාළ නිවස පිටුපස පුද්ගලයින් දෙදෙනෙකු ගංජා පානය කරමින් සිටි බවත්, එම අවස්ථාවේදී එහි සිටි එක් පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බවත්, අනෙක් තැනැත්තා පැන ගිය බවත් ඉහත කී විමර්ශන සටහනෙහි සටහන් කොට ඇත. එමෙන්ම, අත්අඩංගුවට ගත් තැනැත්තා වරෙන්තුකරු වන සඳුන් සාලිත බවට හඳුනා ගත් බවටත්, පැන ගිය පුද්ගලයා සෙනෙවිරත්න (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) බවට අත්අඩංගුවට ගත් පුද්ගලයාගෙන් දැනගත් බවත් එකී සටහනෙහි වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, 2024.01.31 වන දින දෙපාර්ශවය කැඳවා කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරුව කිසිදු අවස්ථාවක අත්අඩංගුවට ගෙන නොමැති බවයි.

කෙසේවෙතත් පැමිණිලිකරු විසින් ඔහුව තම නිවසේදී අත්අඩංගුවට ගත් බවටත්, අත්අඩංගුවට ගැනීමෙන් පසුව පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදුකළ බවටත් දන්වමින් නිකවැරටිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත පැමිණිල්ලක් කර ඇත. මෙකී පැමිණිල්ල මත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් විමර්ශනයක් සිදු කර ඇති බවත්, එහිදී පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල මගින් නම් සඳහන් කර ඇති සාක්ෂිකරුවන් තම කාර්යාලය වෙත කැඳවා ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් නිකවැරටිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් අංක SP/NKD/SVIII/52/2023 සහ 2023.11.16 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, අංක 166, කෝන්වැව, ඉපලෝගම, මහව පදිංචි ඩබ්ලිව්.එච්.එම්.සෙනෙවිරත්න

යන අයට සිදුවූ පහරදීම සම්බන්ධයෙන් නිකවැරටිය කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය විසින් විමර්ශනයක් සිදුකරන ලද බවත්, එම පහරදීම සම්බන්ධ විමර්ශනයේදී පුද්ගලයින් නව දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවත්, එම ප්‍රකාශ තුළින් මෙම පැමිණිලිකරුට පහරදීමක් සිදුවූ බවට කරුණු අනාවරණය නොවූ බවත්, ඒ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් එතෙක් සිදුකරන ලද විමර්ශනය තුළින් පැමිණිලිකරුට පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදුකළ බවට ඉදිරිපත්ව ඇති සාක්ෂි අනුව තහවුරු නොවූ බවත් ය.

පැමිණිලිකරු විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, නිකවැරටිය වෙත කරන ලද පැමිණිල්ල අනුව එම කාර්යාංශය විසින් සිදුකරන ලද විමර්ශනයේ උධෘත කොමිෂන් සභාව වෙත කැඳවා ඇත. එම උධෘත අනුව පුද්ගලයින් නව දෙනෙකුගෙන් ප්‍රකාශ ලබාගෙන ඇති බවත්, එම පුද්ගලයින් අතරින් හය දෙනෙකු සිවිල් පුරවැසියන් වන අතර, තිදෙනෙකු පොලිස් නිලධාරීන් වන බවත් නිරීක්ෂණය වේ.

සිවිල් පුරවැසියන් විසින් ලබාදී ඇති ප්‍රකාශවල සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී සඳුන් සාලිත දිල්ශාන් යන අය විසින් ප්‍රකාශ කොට ඇත්තේ, 2023 මාර්තු මස දිනක කෝන්වැව පදිංචි සෙනෙවිරත්න (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) තම නිවසට උදේ 9.00ට පමණ පැමිණි බවත්, ඔහු සමඟ නිවසේ සාලයේ වාඩි වී සිටින විට පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණි බවත්, එවිට තමාට වරෙන්තුවක් තිබෙන බව සෙනෙවිරත්න (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු)ට දන්වා තමා නිවසේ පිටුපස දොරෙන් පලාගිය බවත් ය. එමෙන්ම, එම සිදුවීමෙන් පසු පැය දෙකක පමණ කාලයක් සැඟවී සිට සෙනෙවිරත්න (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු)ගේ නිවසට ගිය බවත්, නැවත තම නිවසට පැමිණි බවත්, නිවසේ සිටින විට සෙනෙවිරත්න (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු)ට පොලීසියෙන් ගහනවා කියා තමාට සුදු අයියා (අතපත්තු මුදියන්සේලාගේ වසන්ත කුමාර අතපත්තු) නැමති අය දුරකථනයෙන් දන්වා සිටි බවත්, පසුව 2023.03.10 වන දින වරෙන්තුව සඳහා අධිකරණයට ඉදිරිපත්ව දඩ ගෙවා නිවසට පැමිණි බවත්, එවිට පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද පහරදීම් හේතුවෙන් සෙනෙවිරත්න (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) රෝහල්ගතව සිටින බව දැනගත් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. කෙසේවෙතත් අතපත්තු මුදියන්සේලාගේ වසන්ත කුමාර අතපත්තු යන අය විසින් සඳහන් කර ඇත්තේ තමා එවැනි දුරකථන ඇමතුමක් ලබා දුන්නා ද යන්න මතකයක් නොමැති බවත්, සමහරවිට එවැන්නක් සිදුව තිබිය හැකි බවත් ය.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේදී එම්.එම්.සුනිල් ජයරත්න යන අය විසින් ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එමගින් ඔහු ප්‍රකාශ කොට ඇත්තේ, 2023 වර්ෂයේ මාර්තු මාසයේ දිනය මතක නැති අතර රාත්‍රී 9.00ට පමණ තම දුරකථන අංකයට ඇමතුමක් පැමිණි බවත්, එම ඇමතුම ලබා ගත්තේ ගිරිල්ල පොලිස් ස්ථානයේ සේවය කරන කරුණාරත්න නම් නිලධාරියා විසින් වන බවත්, ඔහු තමාට කතා කර "සෙනෙවිරත්න ගිරිල්ල පොලීසියේ ඉන්නවා, නඩුවක් දැම්මෙ නැහැ, එක්කගෙන යන්න එන්න" කියා දන්වා සිටි බවත්, "මේ වෙලාවේ එන්න බැහැ, අලි ඉන්නවා" කියා තමා පැවසූ බවත්, එවිට පොලිස් නිලධාරී කරුණාරත්න "එහෙනම් මම එක්ක ගෙන එන්නම්. ඔයා නිකවැරටිය හැටන්

නැෂනල් බැංකුව ළඟට එන්න" යනුවෙන් පැවසූ බවත්, තමා යතුරු පැදියෙන් හැටන් නැෂනල් බැංකුව ළඟට ගිය බවත්, එවිට වේලාව රාත්‍රී 9.40 පමණ වූ බවත්, තමා යනවිට සෙනෙවිරත්න බැංකුව ඉදිරිපිට මාර්ගයේ අයිනේ සිටි බවත්, "මට අමාරුයි මාව ඉස්පිරිතාලෙට ගිහින් දාන්න" කියා සෙනෙවිරත්න පැවසූ බවත්, එවිට කරුණාරත්න මහතා විසින් "ඉස්පිරිතාලෙට යන්න එපා, පොලීසියේදී හිස් කොලවලට අත්සන් කළා, ඒකට අරක්කු බෝතල් දමපුවාම දඩ ගහනවා" යනුවෙන් පැවසූ විට එම වචනවලට බියවී සෙනෙවිරත්න රෝහලට යාමට බිය වූ නිසා තමා සෙනෙවිරත්නව ඔහුගේ ගෙදරට ගොස් ඇරලවා ගිය බවත් ය.

නායක බණ්ඩාරලාගේ සුරංග කුමාර නායක බණ්ඩාර යන අය විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේදී ප්‍රකාශයක් ලබාදෙමින් පවසා ඇත්තේ, මෙම සිදුවීම සිදුවූ දින වකවානු පිළිබඳව හරියට මතක නැති බවත්, තමා, තම වැඩිමහල් සහෝදරයා හා තවත් අයෙකු සමඟ කටුපිලගහ වැවට පල්ලෙහා හේනක වල් කොටමින් සිටි බවත්, එවිට වේලාව මතක විදියට සවස දෙකට තුනට විතර වූ බවත්, තමා හේනේ සිට ගෙදර යමට පැමිණි බවත්, කටුපිලගහගාව වැවේ පාර අයිනට වෙන්න සෙනෙවිරත්න ඉඳගෙන සිටි බව තමා දුටු බවත්, ඔහු ළඟින්ම පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සිටි බවත්, ඔවුන් සිවිල් ඇඳුමින් සැරසී සිටි බවත්, ඔවුන් සෙනෙවිරත්න ළඟින්ම සිටගෙන සිටි බවත්, තමා එම ස්ථානයේ සිටි පොලිසියේ දෙදෙනාගෙන් එක අයෙකු සමඟ කතා කළ බවත්, තමා ඔවුන් නම් වශයෙන් දන්නේ නැති බවත්, සෙනෙවිරත්නගේ අත්වලට මාංචු දමා තිබුණ නිසා තමා ඒ සිටි අය පොලිස් නිලධාරීන් කියා සිතූ බවත්, පසුව තමා ගෙදර පැමිණි බවත් ය.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිල්ල අනුව ඔහු 2023.03.07 දින උදේ 8.00ට පමණ සඳුන්ගේ නිවසට ගොස් ඇති බවටත්, එම නිවසට එදින පොලිස් නිලධාරීන් පැමිණ ඇති බවටත්, එහිදී සඳුන් යන අයට වරෙන්තුවක් තිබූ බැවින් ඔහු පැනගොස් ඇති බවටත් කරුණු නිරීක්ෂණය වන අතර, සඳුන් සාලිත විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය වෙත ලබාදී ඇති ප්‍රකාශයේ ද එකී කරුණුම ඇතුළත්ව ඇති බැවින් පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කරුණු සහ සඳුන් සාලිතගේ ප්‍රකාශයේ සඳහන් කරුණු සමාන බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පැමිණිල්ල අනුව පැමිණිලිකරු සඳුන් සාලිතගේ නිවසේ සිට ඔහුගේ නිවසට ගොස් ඇති බවත්, එදිනම වගඋත්තරකරුවන් පැමිණිලිකරුගේ නිවසට ද ගොස් ඇති බවත්, එසේ ගොස් පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන කටුපිලගහ වැවට ගෙන ගිය බවත්, එසේ රැගෙන ගොස් ඔහුගේ අත්දෙකට මාංචු දමන ලද බවත්, එම අවස්ථාවේදී චමින්දගේ මල්ලී පැමිණි බවත් දක්වා ඇත.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේදි ඉහත කී නායක බණ්ඩාරලාගේ සුරංග කුමාර නායක බණ්ඩාර විසින් ලබා දී ඇති ප්‍රකාශය මගින් ඔහුගේ අයියා චමින්ද වන බවටත්, ඔහු හේනේ වැඩ කර නිවසට යන විට සෙනෙවිරත්න කටුපිලගහවැවේ පිටියේ බිම වාඩිවී සිටිනු දුටු බවත්, ඔහුගේ අත්දෙකට මාංචු දමා තිබෙන බව තමා දුටු බවත්, එම ස්ථානයේ සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයින්

දෙදෙනෙකු සිටි බවත්, සෙනෙවිරත්ගේ අත්දෙකට මාංචු දමා තිබූ බැවින් එම අය පොලිස් නිලධාරීන් බව සිතූ බවත් ප්‍රකාශ කොට ඇත.

ඒ අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කරුණු හා නායක බණ්ඩාරලාගේ සුරංග කුමාර නායක බණ්ඩාර යන අයගේ ප්‍රකාශයේ සඳහන් කරුණු සැසඳීමේදී දෙදෙනාම විසින් ලබාදී ඇති කරුණු සමාන බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කොට ඇත්තේ, තමාව පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත්, තමාට ඉඳගන්න කියූ බවත්, තර්ජනය කර හිස් කඩදාසි දෙකක අත්සන් කරන්න කියා කියූ බවත්, තමා අත්සන් කළ බවත් ය. පසුව තමාට ගෙදර යන්න කියූ බවත්, එවිට වේලාව රාත්‍රී 7.00 පමණ වූ බැවින් ගෙදර යන්න බැරි බව කියා සිටි බවත්, පහරදීම නිසා අමාරු වූ බැවින් රෝහල්ගත කරන ලෙස ඉල්ලා සිටි බවත්, තමාට පහරදුන් එස්.එන්.ඩබ්ලිව්.එම්. කරුණාරත්න නිලධාරියා විසින් ඔහුගේ ත්‍රීරෝද රථයෙන් නිකවැරටියට තමා ගෙනවිත් දමන ලද බවත්, එවිට වේලාව රාත්‍රී 9.00 පමණ වූ බවත්, එවිට තමාව රෝහලට ගෙන ගොස් ඇරලවන ලෙස කියූ බවත්, එවිට එස්.එන්.ඩබ්ලිව්.එම්. කරුණාරත්න නිලධාරියා හිස් කොලවලට අත්සන් කර ඇති බැවින් රෝහලට නොයා ගෙදර යන ලෙස පැවසූ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එමෙන්ම එස්.එන්.ඩබ්ලිව්.එම්. කරුණාරත්න නිලධාරියාගේ දුරකථනයෙන් ගමේ සුනිල් අයියාට කතා කළ බවත්, එවිට “සෙනෙවි පොලීසියට අහුවෙලා, මේකාට එන්න විදියක් නැහැ, මේකා අරන් යන්න” කියා එස්.එන්.ඩබ්ලිව්.එම්. කරුණාරත්න නිලධාරියා පැවසූ බවත්, එවිට සුනිල් අයියා පැමිණ තමාව ගෙදරට ඇරලවූ බවත් ය.

එලෙස පැමිණිලිකරු විසින් සුනිල් අයියා යනුවෙන් සඳහන් කරන ලද එම්.එම්.සුනිල් ජයරත්න විසින් ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී වෙත ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ගිරිල්ල පොලිස් ස්ථානයේ සේවය කරන කරුණාරත්න නම් නිලධාරියා තමාගේ දුරකථනයට ඇමතුමක් ලබාගෙන “සෙනෙවිරත්න ගිරිල්ල පොලීසියේ ඉන්නවා නඩුවක් දැම්මේ නැහැ ඇවිල්ලා එක්කගෙන යන්න” කියා දන්වා සිටි බවත්, ඒ වේලාවට මාර්ගයේ අලි ගැවසෙන නිසා ඒමට හැකියාවක් නොමැති බව තමා දන්වා සිටි බවත්, එවිට කරුණාරත්න නම් නිලධාරියා සෙනෙවිරත්නව නිකවැරටිය හැටන් නැෂනල් බැංකුව ළඟට එක්කගෙන එන්නම් කියා පැවසූ බවත්, ඒ අනුව තමා නිකවැරටිය හැටන් නැෂනල් බැංකුව ළඟට ගිය බවත්, එවිට සෙනෙවිරත්න බැංකුව ඉදිරිපිට මාර්ගය අයිනේ සිටි බවත්, සෙනෙවිරත්න විසින් ඔහුට අමාරු බැවින් රෝහට රැගෙන යන ලෙස තමාට පැවසූ බවත්, එවිට කරුණාරත්න නිලධාරියා විසින් රෝහලට නොයන ලෙසත් පොලිස් ස්ථානයේ දී හිස් කොලවලට අත්සන් කර ඇති බව කියා සිටි බවත්, පසුව සෙනෙවිරත්න එම ප්‍රකාශයට බියවී රෝහලට නොගොස් ගෙදරට රැගෙන යන ලෙස තමාට දැන්වූ බැවින් තමා සෙනෙවිරත්නව ඔහුගේ නිවසට ඇරලවන ලද බවත් ය.

ඒ අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ල හා ඉහත කී එම්.එම්. සුනිල් ජයරත්නගේ ප්‍රකාශය සැසඳීමේදී දෙදෙනොම ලබාදී ඇති කරුණු සමාන බවත්, 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න

නිලධාරියා විසින් එම්.එම්.සුනිල් ජයරත්න යන අයට දුරකථන ඇමතුමක් ලබා දී පැමිණිලිකරුව රැගෙන යාමට පැමිණෙන ලෙසට සිදු කරන ලද දැනුම්දීම අනුව ඔහු පැමිණ පැමිණිලිකරුව රැගෙන ගොස් ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ බිරිඳ වන ජේ.එච්.එම්. කුෂානි ප්‍රියංකා ජයපත්ම යන අය විසින් 2025.08.25 වන දින කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් නිලධාරීන් පස් හය දෙනෙක් 2023.03.07 වන දින නිවසට පැමිණි බවත්, එම නිලධාරීන් විසින් ඇයගේ ස්වාමි පුරුෂයා වන පැමිණිලිකරුව ඔවුන්ගේ නිවසේදී අත්අඩංගුවටගත් බවත්, තමා හා තම දරුවන් ඉදිරියේ තම ස්වාමි පුරුෂයා වන පැමිණිලිකරුව නිවසේ සිට මීටර් 500ක් පමණ දුරින් ඇති කටුපිලගහවැවට රැගෙන ගිය බවත්, පසුව තමා සහ තම ලොකු පුතා ස්වාමි පුරුෂයා සොයා කටුපිලගහ වැවට ගිය බවත්, එහි යන විට පොලිස් නිලධාරීන් තම ස්වාමි පුරුෂයාගේ අත්දෙක පිටුපසට කර මාංචු දමා පොලුවලින් පහරදෙනු දුටු බවත්, එලෙස පහරදෙමින් මොරගොල්ලාගම පැත්තට රැගෙන ගිය බව තමා දුටු බවත් ය.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිල්ල, ඔහු විසින් ලබාදී ඇති සාක්ෂි හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, නිකවැරටිය විසින් සිදුකරන ලද විමර්ශන අනුව එම කාර්යාලය විසින් පාර්ශව කැඳවා ලබාගෙන ඇති ප්‍රකාශවලට අදාළ සියළුම උධෘත සලකා බැලීමේදී පැමිණිලිකරුව 2023.03.07 වන දින ඔහුගේ නිවසේ සිටියදී 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගෙන ගිරිල්ල පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් රාත්‍රිය වනතෙක් ඔහුව එම පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන ඇති බවත්, අනතුරුව ඔහුට එරෙහිව කිසිදු චෝදනාවක් ගොනු නොකොට 3 වන වගඋත්තරකාර පො.කො. 51801 එස්.එන්.ඩබ්ලිව්.එම්.කරුණාරත්න යන අය විසින් ඔහුගේ වාහනයකින් පැමිණිලිකරුව නිකවැරටියට රැගෙනවිත් එම්.එම්. සුනිල් ජයරත්න යන අයට භාරදී ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් කියා සිටින්නේ, ඔහු නිවසේ සිටියදී පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන පසු ඔහුව කටුපිලගහ වැවට රැගෙන ගොස් අත් පිටුපසට කර මාංචු දමා පොලුවලින් තම කකුල්වලට, පිටට, අත්දෙකට හොඳටම පහරදුන් බවයි. එසේම, ඔහුට එක් පොලිස් නිලධාරියෙකු විසින් පිටට පයින් පහරක් ගසන ලද බවත්, එවිට නියරේ වැදී බිමට වැටුනු බවත්, එම අවස්ථාවේ දී තම පපුව ප්‍රදේශය නියරේ වැදුනු බවත්, පහරදීමෙන් පසු තමාට වමනය ගිය බවත්, පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති කඩයකට ද රැගෙන ගොස් අතින් පහර තුනක් ගසන ලද බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

පැමිණිලිකරුව 2023.03.07 වන දින අත්අඩංගුවට ගෙන ඇති අතර, එදින රාත්‍රියේ වගඋත්තරකාර පාර්ශවය විසින් ඔහු නිවස වෙත යවා ඇත. ඒ අනුව ඔහු නිවසේ සිටියදී එදින රාත්‍රියේ ඇති වූ හදිසි අසනීප තත්ත්වය හේතුවෙන් රාත්‍රියේම මහව රෝහල වෙත ප්‍රතිකාර සඳහා යොමු වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මහව දිස්ත්‍රික් රෝහල වෙතින් යොමු කර ඇති වෛද්‍ය වාර්තාවේ

පැමිණිලිකරු 2023.03.08 වන දින පෙ.ව. 12.30ට පමණ රෝහලට ඇතුලත්ව ඇති බවත්, එහිදී ඔහු 2023.03.07 දින සවස 5.00 සිට අසනීප තත්ත්වයෙන් පසුවන බව සඳහන් කළ බවත්, 2023.03.08 වන දින පෙ.ව. 1.10ට පමණ පැමිණිලිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා නිකවැරටිය රෝහල වෙත මාරු කරන ලද බවත්, මහව රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදුකරන ලද බවට පැමිණිලිකරු දැනුම් දී නැති බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු 2023.03.08 වන දින නිකවැරටිය රෝහලට මාරු කිරීමෙන් පසුව එම රෝහල විසින් නැවත 2023.03.11 වන දින ඔහුව කුරුණෑගල ශික්ෂණ රෝහල වෙත යොමුකර ඇති අතර, කුරුණෑගල ශික්ෂණ රෝහල වෙතින් පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව විසින් කැඳවා ඇත.

අංක 218/23 දරණ පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පැමිණිලිකරු 2023.03.13 දින ප.ව. 20.35ට පරීක්ෂා කර ඇති අතර, රෝගියාගේ ශරීරයේ පවතින තුවාල පහත ලෙස දක්වා ඇත.

"01. 7x10cm Contusion over the posterior aspect of the Right side arm.
02. 4x5cm Contusion over the posterior aspect of the Left side arm.

Managed for inferior ST Elevation Myocardial Infarction at the Base Hospital Nikaweratiya on 08/03/2023 for a chest pain developed on 08/03/2023 around 8 p.m.

**Inferior ST Elevation Myocardial Infarction is an isolated natural incident and not caused by the assault."**

පැමිණිලිකරුගේ ශරීරයේ පවතින ඉහත සඳහන් අංක 01 සහ 02 දරණ තුවාල බරපතල නොවන තුවාල ලෙස සටහන් කොට ඇත.

"<u>Conclusions and Opinions</u>

The injury pattern is consistent with the history given by the injured. These injuries do not need inward management. Inward management was done for the myocardial infarction which is a natural cause." යනුවෙන් අධිකරණ වෛද්‍යවරයා විසින් සිය මතය සටහන් කර ඇත.

එසේම, පැමිණිලිකරු විසින් වෛද්‍යවරයා හට ලබා දුන් කෙටි ඉතිහාසය පහත පරිදි අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කර ඇත.

"2023.03.07 පස්වරු 1ට පමණ කටුපිල වැව අලසදී පොලීසිය හොර අරක්කු අල්ලන්න ඇවිත් අපේ ගෙදරටත් ඇවිත් මාව එක්කන් ගියා. වැව ගාවදි පොලීසියේ පස් දෙනෙක් ගැහුවා. එදා රෑ පපුවේ කැක්කුමක් හැදිලා ඉස්පිරිතාලේ ඇඩ්මිට් වුණා."

පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, තම තට්ටම් ප්‍රදේශයට 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන් යන අය පහරදුන් බවත්, තවත් දෙදෙනෙක් ද පහරදුන් නමුත්, ඔවුන්ගේ නම් නොදන්නා බවත්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් යන අය ඇල්බීසියා ලීවලින් පහරදුන් බවත්, 3 වන වගඋත්තරකාර පො.කො. 51801 කරුණාරත්න යන අයද පහරදුන් බවත් ය. එසේවුවද, පැමිණිලිකරු විසින් සිදු කරනු ලබන ඉහත කී සියලු පහරදීමේ චෝදනාවන් වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිලිකරුව 2023.03.07 වන දින ඔහුගේ නිවසේ සිටියදී අත්අඩංගුවට ගත් බව පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් කියා සිටින අතර, ඔහුට පහරදීමක් සිදුවූ බවද එම පැමිණිල්ල මගින් ප්‍රකාශ කරයි. පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, නිවසේදී වන අතර, ඔහුව අත්අඩංගුවට ගෙන රැගෙන ගිය පසු පැමිණිලිකරුගේ බිරිඳ හා ඔහුගේ ලොකු පුතා පැමිණිලිකරුව සොයා කටුපිලගහ වැවට ගිය බවටත්, කටුපිලගහ වැවට යන විට පැමිණිලිකරුගේ අත්දෙක පිටුපසට කර මාංචු දමා ඔහුට පහරදෙනවා පැමිණිලිකරුගේ බිරිඳ දුටු බවටත්, දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

එමෙන්ම, පැමිණිලිකරුගේ වැඩිමහල් පුත්‍රයා සාක්ෂියක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු සිය මව සහ පියා සමඟ නිවසේ සිටින විට පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණි බවත්, තම පියාව පොලිස් නිලධාරීන් විසින් රැගෙන ගිය බවත්, ඔහුව රැගෙන ගියේ කටුපිලගහ වැවට බවට දැනගත් බවත්, ඔහු සිය මව සමඟ පියාව සොයා කටුපිලගහ වවැට ගිය බවත්, එහි යනවිට තම පියාගේ අත්දෙක පිටුපසට කර බැඳ ඔහුට පොලිස් නිලධාරීන් පහරදෙනවා තමන් දුටු බවත් ය.

පැමිණිලිකරුගේ බිරිඳගේ දිව්රුම් ප්‍රකාශය, වැඩිමහල් පුත්‍රයාගේ ප්‍රකාශය, පැමිණිලිකරුගේ ප්‍රකාශය හා සලකා බැලීමේදී ඔහුගේ බිරිඳ හා පුතා ලබාදී ඇති සාක්ෂි සමාන කරුණු වලින් යුක්ත වන බවට පෙනී යන අතර මෙම අයගේ සාක්ෂි බැහැර කිරීමට තරම් හේතුවක් නොපවතින බව ද පෙනී යයි.

එසේම, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේදී සාක්ෂිකරුවකු ලෙස නායක බණ්ඩාරලාගේ සුරංග කුමාර නායක බණ්ඩාර යන අය විසින් සාක්ෂියක් ලබාදී ඇති අතර, ඔහුගේ සාක්ෂිය මගින් මෙම පැමිණිලිකරු කටුපිලගහවැව ළඟදී පොලිස් නිලධාරීන් සමඟ සිටි බව දුටු බවත්, පැමිණිලිකරුගේ අත්දෙකට මාංචු දමා තිබූ බව ඔහු දුටු බවත් ප්‍රකාශ කර ඇත.

පාර්ශවයන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සියළුම කරුණු හා අධිකරණ වෛද්‍ය වාර්තාව සලකා බැලීමේදී මෙම පැමිණිලිකරු ඔහුගේ නිවසේ සිටියදී අත්අඩංගුවට ගෙන කටුපිලගහවැවට රැගෙන ගොස් අත්දෙකට මාංචු දමා පහරදී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් සිය වෛද්‍ය මතය ලෙස පැමිණිලිකරු විසින් ලබාදී ඇති රෝග ඉතිහාසය හා පවතින තුවාල සැසඳෙන බවට අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ සඳහන් කොට ඇත.

ඒ අනුව 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් පැමිණිලිකරු හට පහර දී ඇති බවට තහවුරු වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතතේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 32(1)(අ) වගන්තිය යටතේ තමා ඉදිරිපිටදී සාමය කඩකිරිමක යෙදෙන යම් තැනැත්තෙකු ද, 32(1)(ආ) වගන්තිය යටතේ සංඥය වරදකට සම්බන්ධ වූ තැනැත්තෙකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේද නැතහොත් ඒ බවට යම් තැනැතුතෙකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරක් ලැබී තිබේද නැතහොත් ඒ බවට යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතීද එවැනි තැනැත්තෙකු අත්අඩංගුවට ගත හැකි බව දක්වා තිබේ.

1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් සාමාන්‍ය වැටලීම් රාජකාරියක යෙදී සිටියදී විශේෂ කාර්යාංශයේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගෙන් තොරතුක් ලැබී ඇත්තේ සඳුන් සාලිත යන වරෙන්තුකරු සම්බන්ධයෙනි. ඒ අනුව වගඋත්තරකරුවන් වරෙන්තුකරු පදිංචි ස්ථානය වැටලීම් කර ඇති අතර, වරෙන්තුකරු පැනගොස් ඇත. එම ස්ථානයේ පැමිණිලිකරු සිට ඇති බැවින් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් ඉහත කී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ වගන්ති ප්‍රකාරව කිසිදු විශ්වාස කටයුතු තොරතුරක්, සාධාරණ පැමිණිල්ලක් හෝ සැකයක් ඇතිකර ගැනීමට තරම් කරුණු නොතිබියදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් සාධාරණ පැමිණිල්ලක්, විශ්වාස කටයුතු තොරතුරක් හෝ සාධාරණ සැකයක් නොමැතිව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත කොට ඇති නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය, යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද, ඒ හේතුව එම තැනැත්තාට දැන්විය යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 32(1)(අ) සහ (ආ) වගන්ති මගින් දක්වා ඇති ආකාරයට පැමිණිලිකරුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක්, විශ්වාස කටයුතු තොරතුරක්, හා සාධාරණ සැකයක් ඇතිකර ගැනීමට තරම් කරුණක් නොතිබියදී මෙකී වගන්තිවල සඳහන් නීතිමය ප්‍රතිපාදන උල්ලඝණය කරමින් කටයුතු කිරීම සහ අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 39 වගන්තිය මගින් දක්වා ඇති පරිදි වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තෙකු ඔහුගේම බැඳුම්කරය පිට හෝ ඇප පිට හෝ මහේස්ත්‍රාත්වරයෙකුගෙන් විශේෂ ලිඛිත ආඥාවක් යටතේ හෝ මිස නිදහස් නොකළ යුතුය යන නීතිමය ප්‍රතිපාදනය අනුව කටයුතු නොකිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ද 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් උල්ලංඝණය කර ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් **මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා** එදිරිව **පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය** **(SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො. කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් 4 වන වගඋත්තරකාර ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ නියෝග පරිදි 2023.03.07 වන දින පැය 08.20ට ගිරිල්ල පොලිස් වසමේ වැටලීම් රාජකාරි සඳහා පිටත්ව ගොස් ඇති බව පොලිස් ස්ථානයේ ප්‍රජා පොලිස් අංශයේ දෛනික තොරතුරු සටහන් කිරීමේ පොතේ පිටුව 155 සහ ඡේදය 52 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. එකී වැටලීම් රාජකාරී අතරතුර සාධාරණ පැමිණිල්ලක්, විශ්වාස කටයුතු තොරතුරක් හෝ සාධාරණ සැකයක් නොමැතිව පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බැවින් සහ පැමිණිලිකරුව වධහිංසනයට ලක් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් 4 වන වගඋත්තරකාර ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 4 වන වගඋත්තරකාර ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් ඔහුගේ අධීක්ෂණ වගකීම යටතේ ක්‍රියාකර ඇති ආකාරය අනුව

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 4 වන වගඋත්තරකාර ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 සහ 13(1) ව්‍යවස්ථාවන් ද, 4 වන වගඋත්තරකාර ගිරිල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. 1 වන වගඋත්තරකාර පො.සැ. 23427 සමන්, 2 වන වගඋත්තරකාර පො.කො. 77528 කසුන් සහ 3 වන වගඋත්තරකාර පො.කො. 51801 කරුණාරත්න යන නිලධාරීන් විසින් එක් අයෙකුගෙන් රුපියල් පනස්දහස(රු.50,000/-)ක මුදලක් බැගින් රුපියල් එක් ලක්ෂ පනස්දහස (රු.150,000/-)ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 04 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් සහ පොලිස්පතිවරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් අනෙක් පිටුවෙහි ඇත. ⟶

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.